## තුන්වැනි කොටස

## මුදල් මණ්ඩලය විසින් 1979 දී උපයෝගී කරගනු ලැබූ ප්‍රධාන පරිපාලන විධිවිධාන

පිටුව


1. ම. කො. ආ. කොමිසමේ ව්‍යවසායයන් සඳහා බැංකු මූල්‍ය පහසුකම් සලසා දීම පිළිබඳව උපදෙස්-චක්‍රලේඛ අංක 379 .. 118

2. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය — චක්‍රලේඛ අංක 380 (එෆ්.සී.බී.එස් 1/79) .. 119

3. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය — චක්‍රලේඛ අංක 381 (එෆ්.සී.බී.එස්. 2/79) .. 120

4. වාණිජ බැංකු ණය — චක්‍රලේඛ අංක 395 .. 120

5. වාණිජ බැංකු ණය — චක්‍රලේඛ අංක 418 .. 120

6. වාණිජ බැංකු ණය පහසුකම් — චක්‍රලේඛ අංක 419 .. 121

7. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය — ව්‍යවහාර මුදල් නම් කිරීම — යොමු අංක එෆ්.සී බී.එස්. 3/79/බී.සී./එෆ් 1049/79 .. 122

8. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය — චක්‍රලේඛ අංක එෆ්.සී.බී.එස්. 4/79 .. 122

9. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය — චක්‍රලේඛ අංක එෆ්.සී.බී.එස්. 5/79 .. 123

10. ආසියානු මූල්‍ය ඒකකය, බංගලදේශ ටාකා, බුරුම ක්‍යාට්, ඉන්දියානු රුපියල, අයිරාන රියාල්, නේපාල රුපියල හා පකිස්තානු රුපියල සඳහා මහ බැංකු විනිමය අනුපාතිකයන් .. 124

11. ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු සඳහා වෙළෙඳ බැංකු විනිමය අනුපාතිකයන් .. 125

12. වෙළෙඳ බැංකු වලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිළදී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන් .. 126

චක්‍රලේඛ අංක: 379

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1979 මැයි මස 02 වැනි දින.

## ම. කො. ආ. කොමිසමේ ව්‍යවසායයන් සඳහා බැංකු මූල්‍ය පහසුකම් සළසා දීම පිළිබඳව උපදෙස්

ශ්‍රී ලංකාවේ ඕනෑම වාණිජ බැංකුවකට, මහ කොළඹ ආර්ථික කොමිසම් පණතේ (ම. කො. ආ. කො. ව්‍යවසායයන්) අංක 17 දරණ ඡේදය යටතේ ගිවිසුම්වලට එළඹ ඇති ව්‍යවසායයන්ට අවශ්‍ය බැංකු පහසුකම් සපයා දිය හැකිය. එසේ සැපයීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය. මොනයම් හෝ වාණිජ බැංකුවකට එවන් අවස්ථාවකදී තම ශාඛාවක් ආයෝජන දිරි ගැන්වීමේ කලාපයේ පිහිටා තිබීම අවශ්‍ය නොවේ.

**උපදෙස්**

1. ම. කො. ආ. කො. ව්‍යවසායයන්ට රුපියල් මූල්‍ය පහසුකම් සැළසීමේදී, 1978 ඔක්තෝබර් මස 25 වැනි දින හා රෙගුලාසි 7 (ඇ) දරණ පහත සඳහන් කොන්දේසිය බැංකු විසින් සිත්හි තබා ගත යුතුය:—

   "1978 අංක 4 දරණ මහ කොළඹ ආර්ථික කොමිසම් පණතේ 17 වැනි ඡේදය යටතේ ව්‍යවසායයක් සමඟ එළඹෙන සෑම ගිවිසුමක්ම නිශ්චිත වශයෙන් ········ ව්‍යවසායයක සියළුම කාරක ප්‍රාග්ධනය සඳහා යෙදිය යුත්තේ ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන ලද පරිවර්තිත විදේශ ව්‍යවහාර මුදලකිනි. මේ පිළිබඳව වෙනසක් කළ හැක්කේ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව නිදහස් කළහොත් පමණි".

2. වාණිජ බැංකුවක් මගින් ම. කො. ආ. කො. ව්‍යවසායයකට අනුමත කරන ණය මුදල් හෝ අත්තිකාරම්, 1978 දෙසැම්බර් මස අවසානයට තිබුණු මුළු ණය සහ අත්තිකාරම් එකතුවේ සියයට දෙකක ප්‍රමාණය නොඉක්ම විය යුතුය. එසේ වුවද, එකී බැංකුවේ 1978 දෙසැම්බර් මස 31 දිනට තිබුණු වැඩිවූ තැන්පතුවල සියයට විස්සක ප්‍රමාණය ඉක්ම නොයන පරිදි ඉහත කී සීමාව ඉක්මවිය හැකිය.

3. ම. කො. ආ. කො. ව්‍යවසායයන් සමඟ වාණිජ බැංකුවක් විසින් කරනු ලබන සියළුම ගණුදෙනු සඳහා වෙනම ගිණුම් පොත් තබා ගත යුතුය.

4. ම. කො. ආ. කො. ව්‍යවසායයක්, ඔවුන්ගේ අරමුදල් සඳහා සාමාන්‍ය වශයෙන් විදේශ සම්පත් යොදවන බැව් අපේක්ෂා කරන හෙයින්, බැංකු මගින් ප්‍රදනය කරන රුපියල් සහාය අවම වශයෙන් විය යුතුය. ඊට සමානුරූපීව, ම. කො. ආ. කො. ව්‍යවසායයන් සඳහා බැංකු මගින් දෙනු ලබන ණය මුදල් සහ අත්තිකාරම් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඉටු කරන ඇප වීම, ව්‍යවසායයන් එකින් එක වෙන වෙනම සලකා බලා කෙරෙන අතර එසේ අනුකූලතාවය දක්වන්නේ බැංකු මගින් ප්‍රදනය කොට ඇති ණය සහ අත්තිකාරම් සම්පූර්ණයෙන්ම ඉහත දක්වා ඇති කොන්දේසියට එකඟ නම් පමණි. මීට අමතරව එකින් එක වෙන වෙනම සැළකිල්ලට භාජනය කරමින් සීමිත දේශීය විදේශීය මුදල් හුවමාරු පහසුකම් ද දීම සලකා බලනු ඇත.

වී. එස්. සුබ්‍රමනියම්
ප්‍රධාන ගණකාධිකාරී

චක්‍ර ලේඛ අංක: 380 (එෆ්සීබීඑශ් 1/79)

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ. 1
1979 මැයි මස 02 වැනි දින.

## විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය

1. ශ්‍රී ලංකාවේ කටයුතු කරන වෙළෙඳ බැංකු වලට මෙම චක්‍ර ලේඛයේ දක්වා ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය (වි. ව්‍ය. මු. බැ. ක්‍ර.) ට සහභාගි විය හැකිය.

2. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ කැරෙන මෙහෙයවුම් කටයුතු කළ යුතුව ඇත්තේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය පවරණු ලැබූ, එකී කාර්යය සඳහා සංස්ථාපිත වෙළෙඳ බැංකුවක විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් (වි.ව්‍ය.මු.බැ.ඒ) මගින් පමණි

3. වි. ව්‍ය. මු. බැ. ඒ. යටතේ මෙහෙයවුම් කටයුතු කිරීමට මනාපය පළ කරණ වෙළෙඳ බැංකුවක් එසේ කිරීමට අවසර ලබා ගැනීම සඳහා පහත සඳහන් විස්තර දක්වමින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අයදුම් කළ යුතුය:–

(අ) වි. ව්‍ය. මු. බැ. ඒ. හි සේවයේ යොදවනු ලබන විධායක මට්ටමේ අයවළුන්ගේ නම්, ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා බැංකු කටයුතු පිළිබඳ පළපුරුද්ද, හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා ගැනීමට කැමති වෙනත් විස්තරද ඉදිරිපත් කළ යුතුය.

(ආ) වි. ව්‍ය. මු. බැ. ඒ හි ඇති වෙතැයි බලාපොරොත්තු වන කිසියම් ද්‍රවශීලතා හෝ වෙනත් හිභයක් සඳහා ප්‍රතිපාදනයන් කිරීමට ඉල්ලූ විටකදී නිමිති ව්‍යවහාර මුදල් ලබා දෙන බවට ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත වෙළෙඳ බැංකු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් දෙනු ලබන පොරොන්දුවක් ඉදිරිපත් කළ යුතුය.

4. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් පහත සඳහන් කටයුතු වල නිරත වනු ඇත.

(අ) ඕනෑම අනේවාසිකයෙකුගෙන් කවර හෝ නිමිති විදේශ මුදලක් කාලීන සහ ඉල්ලුම් තැන්පතු (ඉතිරි කිරීමේ ගිණුම් හෝ චෙක් පතක් මගින් මුදල් ආපසු ගන්නා ගිණුම් හෝ විවෘත නොකළ යුතුය.) වශයෙන් බාරගත හැකි මුත්, කාලීන තැන්පතු සම්බන්ධයෙන් එක්සත් ජනපද ඩොලර් (ඇමරිකානු ඩොලර් 10,000) දස දහසකට හෝ ඊට සමාන ප්‍රමාණයක් භාර ගත හැකිය.

(ආ) ඕනෑම අනේවාසිකයෙකුගෙන් ඕනෑම නිමිති විදේශ මුදල් ප්‍රමාණයක් සීමාවකින් තොරව ණයට ගත හැකිය.

(ඇ) ඕනෑම අනේවාසිකයෙකුට ඕනෑම නිමිති විදේශ මුදල් ප්‍රමාණයක් සීමාවකින් තොරව, ණය සහ අත්තිකාරම් වශයෙන් ලබාදිය හැකිය.

(ඈ) තවත් ඕනෑම වි. ව්‍ය. මු. බැ. ඒකකයක් සමග ඕනෑම නිමිති විදේශ ව්‍යවහාර මුදලකින් ඕනෑම මුදල් ගනුදෙනුවක් කළ හැකිය.

(ඉ) නිමිති විදේශ ව්‍යවහාර මුදලකින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලබන වෙනත් ඕනෑම මුදල් ගණුදෙනුවක් කළ හැකිය.

5. (අ) වි. ව්‍ය. මු. බැ. ඒකකයකට වාණිජ බැංකුවක් වන ඕනෑම නේවාසිකයෙකුගෙන් ඕනෑම නිමිති විදේශ ව්‍යවහාර මුදලකින් කාලීන සහ ඉල්ලුම් තැන්පතු බාර ගත හැකි අතර එවැනි නේවාසිකයෙකුට ණය මුදලක් හෝ අත්තිකාරමක් ඕනෑම නිමිති විදේශ ව්‍යවහාර මුදලකින් දිය හැකිය. ඉහත කී තැන්පතු, ණය මුදල් සහ අත්තිකාරම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන අවම පරිමාණයට වඩා අඩු නොවිය යුතු අතර, උපරිම ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතුය.

(ආ) වි. ව්‍ය. මු. බැ. ඒකකයකට එවැනි ගණු දෙනු සම්බන්ධයෙන්, වාණිජ බැංකුවක්, වි. ව්‍ය. මු. බැ. ඒකකයක් ඇති වාණිජ බැංකුවක් ඇතුළත්ව, එවැනි තැන්පතු බාර ගැනීමට හෝ එවැනි ණය සහ අත්තිකාරම් ලබා ගැනීමට හෝ බල පවත්නා රෙගුලාසි සහ පිළිවෙත් යටතේ සැහීමකට පත් විය යුතුය.

6. තවද වි. ව්‍ය. මු. බැ. ඒකකයක්:

(අ) මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යවසායක ඕනෑම නේවාසිකයෙකුගෙන් කවර හෝ නිමිති විදේශ ව්‍යවහාර මුදලක් කාලීන සහ ඉල්ලුම් තැන්පතු (ඉතිරි කිරීමේ ගිණුම් හෝ චෙක්පතක් මගින් මුදල් ආපසු ගන්නා ගිණුම් හෝ විවෘත නොකළ යුතුය.) වශයෙන් බාර ගත හැකිය. නමුත්, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද කිසියම් භාණ්ඩ හෝ සේවාවන්ගෙන් ලබන විදේශ මුදල් හෝ මහ කොළඹ ආර්ථික කොමිසම සමඟ ඇතුලත්ව ඇති කවර හෝ ගිවිසුමක් හේතුවෙන් යට කී විදේශ මුදල් ලැබීමක් හෝ එවැනි තැන්පතුවක් ලෙස ඉදිරිපත් කිරීමේදී කවර හෝ නීතියක් හෝ රෙගුලාසියක් මගින් අවහිරයක් ඇති නොවේ. ඉහත 'ආ' හි දක්වෙන කරුණ සඳහා, අපනයනය කරන ලද භාණ්ඩ සහ සේවාවන්ගේ ස්වභාවය විග්‍රහ කරන ලද ඊට අදාල ප්‍රකාශයක්, අපනයන ලැබීම් ප්‍රමාණය සහ බිල්පත් ඇතුළු අපනයන ලිය කියවිලි පිළිබඳ විස්තර අඩංගුව එකී අපනයන සම්බන්ධිත අනෙකුත් විස්තරත්, එවැනි නේවාසිකයෙකුගෙන් වි. ව්‍ය. මු. බැ. ඒකකය මගින් ලබාගත යුතුය.

(ආ) ම. කො. ආ. කොමිසමේ ව්‍යවසායකයෙකු වන නේවාසිකයෙකුට නිමිති ඕනෑම විදේශ මුදලක් ඕනෑම ප්‍රමාණයකින්, ණය සහ අත්තිකාරම් ස්වභාවයෙන් ලබා දිය හැකිය. මෙවැන්නක් දිය හැක්කේ එවැනි ව්‍යවසායක් මගින් ශ්‍රී ලංකාව තුල කෙරෙන ගණුදෙනු සඳහා මිස වෙනත් බාහිර කටයුත්තකට නොවේ.

7. (අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද හෝ එවැනි කරුණු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලබන්නාවූ හෝ අනෙකුත් ඕනෑම නේවාසිකයෙකුගෙන් කවර හෝ නිමිති විදේශ ව්‍යවහාර මුදලක් කාලීන සහ ඉල්ලුම් තැන්පතු (ඉතිරි කිරීමේ ගිණුම් හෝ චෙක් පතක් මගින් මුදල් හරකොට ගන්නා ගිණුම් හෝ විවෘත නොකළ යුතුය.) වශයෙන් වි. ව්‍ය. මු. බැ. ඒකකයක් මගින් බාරගත හැකි අතර ණය මුදලක් හෝ අත්තිකාරමක් ඕනෑම නිමිති විදේශ ව්‍යවහාර මුදලකින් දිය හැකිය.

(ආ) ඉහත (අ) යටතේ දෙන ලද ණය මුදල් හෝ අත්තිකාරම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන අවම ප්‍රමාණයට වඩා අඩු නොවිය යුතු අතර, උපරිම ප්‍රමාණයටද වැඩි නොවිය යුතුය.

8. වි ව්‍ය. මු. බැ. ඒකකයක වත්කම්/වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විටින් විට තීරණය කරනු ලබන සීමාවන් ඉක්ම නොවිය යුතුය.

9. වාණිජ බැංකුවක්, වි. ව්‍ය. මු. බැ. ඒකකයක ඒකකයක් හෝ දෙපාර්තමේන්තුවක් වශයෙන් ගණු දෙනු කිරීමේදී අනෙකුත් ගනුදෙනු සඳහා වෙනම පොත් සහ වාර්තා තබා ගත යුතු අතර, ඒවා මෙකී චක්‍රලේඛයේ දක්වා ඇති කොන්දේසි ප්‍රකාර ගනුදෙනු කිරීමේදී පරිහරණය කරනු ලබන්නාවූ පොත් සහ වාර්තා වලින් වෙනස් විය යුතුය.

10. වි ව්‍ය. මු. බැ. ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන්නාවූ වාණිජ බැංකුවක්, අවශ්‍ය වුවහොත්, මෙම චක්‍ර ලේඛය ප්‍රකාර එවැනි වාණිජ බැංකුවක් විසින් කරනු ලබන්නාවූ ගණුදෙනු සම්බන්ධයෙන් එවැනි ප්‍රකාශන හෝ වාර්තා අවශ්‍ය යැයි සලකනු ලැබුවහොත් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

11. ශ්‍රී ලංකා මහ බැංකුව තම අභිමතය පරිදි, වි. ව්‍ය. මු.බැ. ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන ඕනෑම වාණිජ බැංකුවකට පූර්වෝක්ත ක්‍රමයෙන් ඉවත් වීමට හෝ ගණුදෙනු කටයුතු සීමා කිරීමට හෝ මේ චක්‍රලේඛය ප්‍රකාරව නියම කරනු ලැබිය හැකිය.

12. (අ) මුදල් නීති පණතේ අංක 127 දරණ ඡේදයේ දක්වා ඇති අරුතම "වාණිජ බැංකුව" යන පදයෙහි ගැබ්වේ.

(ආ) "විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකය" ( වි. ව්‍ය. මු. බැ. ඒ. ) යන්නෙන්, මෙම චක්‍ර ලේඛය ප්‍රකාර කටයුතු කිරීමට පිහිටුවන ලද කොළඹ නගරයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලැබූ ස්ථානයක පිහිටි බැංකු ශාඛාවක ඇති ඒකක යක් හෝ දෙපාර්තමේන්තුවක් හැඳින්වේ.

(ඇ) "විදේශීය ව්‍යවහාර මුදල්" යනු ශ්‍රී ලංකා රුපියල් නොවන අනෙක් ඕනෑම ව්‍යවහාර මුදලකි.

(ඈ) "නිර්මිත විදේශ ව්‍යවහාර මුදල්" යනු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විටින් විට අනුමත කරනු ලබන්නාවූ විදේශ ව්‍යවහාර මුදල්ය.

(ඉ) 1978 අංක 4 දරණ පණත යටතේ පිහිටුවනු ලැබූ මහ කොළඹ ආර්ථික කොමිසම සමග, එකී පණතේ අංක 17 දරණ ඡේදය ප්‍රකාර ගිවිසුමකට එළඹියාවූ ව්‍යවසායක්, "ම. කො. ආ. කො. ව්‍යවසාය" යනුවෙන් හැඳින්වේ.

(ඊ) "අනේවාසිකයා" යනුවෙන් කවර හෝ පුද්ගලයෙක්, සමාගමක්, සංස්ථාපිත මණ්ඩලයක්, වෙනත් නෛතික පුද්ගලයෙක් හෝ පහත සඳහන් "නේවාසිකයා" යන නිර්වචනයට ඇතුළත් නොවන බද්ධ නොවූ මණ්ඩලයක් හැඳින්වේ.

(උ) "නේවාසිකයා" යනු

1. ශ්‍රී ලංකාවේ වෙසෙන පුරවැසියෙක්;

2. ශ්‍රී ලංකා පුරවැසියෙක් නොවන එහෙත් සය මසක කාල පරිච්ඡේදයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ විසූ හෝ දිගටම වාසය කරන හෝ වාසය කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයෙක්;

3. ඕනෑම ව්‍යවස්ථාගත නීතියක් යටතේ පිහිටවූ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ සමාගමක්, සංස්ථාපිත මණ්ඩලයක් හෝ ඒකාබද්ධ නොවූ මණ්ඩලයක්;

4. විදේශයක බල පවත්නා නීතියක් යටතේ පිහිටුවා ඇති හෝ ඒකාබද්ධ කරන ලදුව ක්‍රියාත්මක වන්නා වූ, ශාඛාවක්, අතිරේක සමාගමක්, අනුබද්ධ සමාගමක්, නවතමයෙන් එක් කළ ශාඛාවක්, කාර්යාලයක් හෝ සමාගමක අන් කවර හෝ ඒකකයක් හෝ වෙනත් නෛතික පුද්ගලයෙක්;

13. මෙම චක්‍රලේඛයේ අඩංගු විධි විධාන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විටින් විට සංශෝධනය හෝ ප්‍රති ශෝධනය කෙරෙනු ඇත.

14. පහත සඳහන් එක් එක් ඡේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් ක්‍රියා කරන බලධරයින් පහත දක්වා ඇත:—

| | | | |
|---|---|---|---|
| 3 | ඡේදය | — | බැංකු පරිපාලන අධ්‍යක්ෂ. |
| 4 | (ඉ) | — | විනිමය පාලක. |
| 5 | (අ) | — | ප්‍රධාන ගණකාධිකාරී. |
| 7 | (අ) | — | විනිමය පාලක. |
| 7 | (ආ) | — | ප්‍රධාන ගණකාධිකාරී. |
| 8 | | — | බැංකු පරිපාලන අධ්‍යක්ෂ. |
| 10 | | — | බැංකු පරිපාලන අධ්‍යක්ෂ සහ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ |
| 11 | | — | බැංකු පරිපාලන අධ්‍යක්ෂ. |
| 12 | (ආ) | — | බැංකු පරිපාලන අධ්‍යක්ෂ. |
| 12 | (ඇ) | — | ප්‍රධාන ගණකාධිකාරී. |
| 13 | | — | විනිමය පාලක. |

**වී. ඇස්. සුබ්‍රමනියම්**
ප්‍රධාන ගණකාධිකාරී.

**ඒ. ආර්. ප්‍රනාන්දු**
විනිමය පාලක.

**චක්‍රලේඛ අංක: 381 (එ/ජසීබීඑස් 2/79)**

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ.
1979 මැයි මස 17 වැනි දින.

**සියළුම වාණිජ බැංකු වෙතටයි:**

## විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය

ඉහත සඳහන් කරුණ පිළිබඳ 1979-05-02 දින හා අංක 380 (එ/ජසීබීඑස් 1/79) දරණ චක්‍රලේඛයේ 12 (ඇ) හා 14 යන වගන්ති කෙරෙහි වාණිජ බැංකුවල අවධානය යොමු කරවන අතර දැනට එහි සඳහන් කර ඇති නම් කරන ලද ව්‍යවහාර මුදල් වනුයේ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරය හා රන් පවුම බව ඔවුන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

**වී. එස්. සුබ්‍රමනියම්**
ප්‍රධාන ගණකාධිකාරී.

---

**චක්‍රලේඛ අංක: 395**

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. අංක. 590,
කොළඹ-1.
1979 ජුනි මස 25 වැනි දින.

## වාණිජ බැංකු ණය

1978 අගෝස්තු 07 වැනි දින හා අංක: 317 දරන චක්‍රලේඛයට වැඩිමනත්වයි. වාණිජ බැංකු විසින් ලන්ඩන් වෙන්දේසි සඳහා යවනු ලබන තේ වෙනුවෙන් රාජ්‍ය වැවිලි සංස්ථාවට හා ජනවසමට (ජනවසම) දෙනු ලබන යම් අත්තිකාරම් මුදලක් වේද, එය ඉහත සඳහන් චක්‍රලේඛය මගින් සංස්ථා ණය වෙනුවෙන් පනවා ඇති ණය උපරිමයෙන් නිදහස් කර ඇති බව වාණිජ බැංකු වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

**වී. එස්. සුබ්‍රමනියම්**
ප්‍රධාන ගණකාධිකාරී.

**ඩබ්ලිව්. රාසපුත්‍රම්,**
අධිපති.

---

**චක්‍ර ලේඛ අංක: 418**

ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590,
කොළඹ 1.
1979 සැප්. මස 4 වැනි දින.

## වාණිජ බැංකු ණය

වාණිජ බැංකු විසින් 1978 අගෝස්තු 07 වැනි දින හා අංක. 317 දරන මහ බැංකු චක්‍රලේඛය මගින් පනවා ඇති පරිදි මූල්‍යමය හා ණය දෙන ආයතනවලට හැර රජයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට දෙනු ලබන අත්තිකාරම් පිළිබඳ සීමා කිරීම් අවලංගු කළ බව වාණිජ බැංකු වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

**වී. එස්. සුබ්‍රමනියම්**
ප්‍රධාන ගණකාධිකාරී.

**එච්. එන්. එස්. කරුණාතිලක**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති.

චක්‍රලේඛ අංක: 419

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1979 සැප්. මස 4 වැනි දින

## වාණිජ බැංකු ණය පහසුකම්

බැංකු අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් වාණිජ බැංකුවක් ලබා ගන්නා ලද ණය මුදල්වල ගෙවා නිම කිරීමට ඇති මට්ටම එකී බැංකුවේ 1979 ජුනි 30 දිනට ඇති පහත සඳහන් වත්කම් අයිතමයන්ගේ අගයේ සියයට හතරට වඩා නොඉක්මවිය යුතු බවත්, එය 1979 සැප්තැම්බර් 4 දින සිට ක්‍රියාත්මක වන බවත් සියළුම වාණිජ බැංකුවලට මින් දැනුම් දෙනු ලැබේ.

1. වට්ටම් කරන ලද සහ මූල්‍යානය කරන ලද බිල්පත්
2. ණය දීම් (රජයේ කෘෂිකාර්මික ණය ආධාර යෝජනා ක්‍රමය යටතේදෙන ලද ණය මීට ඇතුළත් නොවේ.) සහ
3. අයිරා

මේ තත්ත්වය අනුව, ''මහ බැංකුවෙන් ගන්නා ලද ණය'' යටතට, රජයේ කෘෂිකාර්මික ණය ආධාර යෝජනා ක්‍රමයයන්, සහතික මිල ක්‍රමය සහ මැදි කාලීන සහ දීඝී කාලීන ණය අරමුදල යටතේ දෙන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් නොගැනේ.

කෙසේ වුවද, තාවකාලික මුදල් හිඟයන් පිරිමසා ගැනීම උදෙසා වාණිජ බැංකු මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්, දක්වා ඇති සීමාව ඉක්මවා පවා සලකා බැලීමට ශ්‍රී ලංකා මහ බැංකුව සූදානම්ය. එවැනි පහසුකම් පහත සඳහන් පදනම යටතේ සලසනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | නියමිත සීමාවට වැඩි පළමු සියයට දහය | — | වර්ෂයකට සියයට 15 |
| (ii) | නියමිත සීමාවට වැඩි දෙවැනි සියයට දහය | — | වර්ෂයකට සියයට 16 |
| (iii) | නියමිත සීමාවට වැඩි තුන්වැනි සියයට දහය | — | වර්ෂයකට සියයට 18 |
| (iv) | නියමිත සීමාවට වැඩි හතරවැනි සියයට දහය | — | වර්ෂයකට සියයට 20 |
| (v) | නියමිත සීමාවට වැඩි පස්වැනි සියයට දහය සහ | — | වර්ෂයකට සියයට 22 |
| (vi) | ඉතිරිය | — | වර්ෂයකට සියයට 25 |

1977 නොවැම්බර් 16 දින අංක 258 දරණ මහ බැංකු චක්‍රලේඛය අවලංගු කර ඇත. කෙසේ වුවද, 1976 නොවැම්බර් 4 දින නිකුත් කරන ලද අංක 169 දරණ චක්‍රලේඛයේ 2 ඡේදයේ විධිවිධාන තවදුරටත් බලපැවැත්වේ. ඒ අනුව වාණිජ බැංකුවක් විසින්ම පහත සඳහන් දෑ ක්‍රියාත්මක වන බවට වගබලා ගත යුතුය;

(අ) අත්‍යාවශ්‍ය නොවන කාර්‍යයන් සඳහා බැංකුවක් මගින් දෙන ලද ණය සහ අත්තිකාරම් වල මුළු වටිනාකම, එවැනි කාර්‍යයන් සඳහා දෙන ලදුව 1976 ජුනි 30 දිනට හිඟව තිබූ මුළු ණය සහ අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය. සහ

(ආ) බැංකු නොවන සමාගම් වලට සහ මහජනයා වෙත මුදල් ණයට දීමේ ව්‍යාපාරයන්හි නිරතව සිටින සමාගම් සහ කුලීපිට ගැණුම් ව්‍යාපාරයන්හි යෙදී සිටින සමාගම්වලට හෝ දෙන ලද ණය සහ අත්තිකාරම් වල මුළු අගය එවැනි සමාගම් සහ ආයතනවලට දෙන ලදුව 1976 ජුනි 30 දිනට හිඟව තිබූ මුළු ණය සහ අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

වී. එස්. සුබ්‍රමනියම්
ප්‍රධාන ගණකාධිකාරී.

එච්. එන්. එස්. කරුණාතිලක
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති.

**යොමු අංකය: එෆ්ජ්සීබීඑස් 3/79/බීසී/එෆ්. 1049/79**

**මෙහෙයවුම් උපදෙස් අංක බීසී 29/79**
**සියළුම වාණිජ බැංකු වෙතටයි.**

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ. 1.
1979 සැප්. මස 28 වැනි දින.

## විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය
## ව්‍යවහාර මුදල් නම් කිරීම

1979 මැයි 2 හා අංක 380 (එෆ්ජ්සීබීඑස් 1/79) දරණ අපගේ චක්‍රලේඛය සම්බන්ධවයි.

ඉහත සඳහන් චක්‍රලේඛයේ 14 වැනි වගන්තිය ප්‍රකාර, පහත දැක්වෙන ව්‍යවහාර මුදල් එම චක්‍රලේඛයේ 4 වැනි වගන්තියේ කාර්යයන් සඳහා නම් කරන ලද විදේශීය ව්‍යවහාර මුදල් වශයෙන් අනුමත කර ඇත.

| | |
|---|---|
| ප්‍රංශ ප්‍රෑන්ක් | ජපන් යෙන් |
| නෙදර්ලන්ත ගිල්ඩර්ස් | රන් පවුම් |
| ස්වීඩන් ක්‍රෝනර් | ස්විස් ප්‍රෑන්ක් |
| ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | බටහිර ජර්මන් මාක්ස් |

**එච්. ප්‍රේමරත්න**
වැඩබලන ප්‍රධාන ගණකාධිකාරී.

---

චක්‍රලේඛ අංක: එ/ජ්සීබීඑස්/4/79

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1979 ඔක්. මස 29 වැනි දින.

## විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය

1979-05-02 වැනි දින හා අංක 380 (එ/ජ්සීබීඑස් 1/79) දරණ චක්‍රලේඛය සම්බන්ධවයි.

ඉහත සඳහන් චක්‍රලේඛයේ 14 වැනි ඡේදය සමග කියැවෙන 13 වැනි ඡේදය ප්‍රකාර එම චක්‍රලේඛයේ විධිවිධානයන් මෙහි පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

6 (අ) ඡේදය කපා හැර, ඒ වෙනුවට පහත සඳහන් ඡේදය 6 (අ) ඡේදය වශයෙන් ඇතුළත් කරන්න.

''6 (අ) ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ අපනයනය කිරීමෙන් හා ශ්‍රී ලංකාවෙන් කැරෙන සේවාවන් වෙනුවෙන් මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යාපාරික කටයුතුවල යෙදී සිටින ව්‍යවසායයක් වූ කිසියම් නේවාසිකයකු වෙත ලැබෙන විදේශීය ව්‍යවහාර මුදල්, තැන්පතු වශයෙන් භාර නොගන්නේ නම් පමණක් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක විසින් ඔවුන්ගෙන් ලැබෙන නම් කරන ලද විදේශීය ව්‍යවහාර මුදල් වලින් ලැබෙන කාලීන හා ඉල්ලුම් තැන්පතු (එහෙත් ඉතිරි කිරීම් ගිණුමේ හෝ චෙක්පතකින් අරමුදල් ලබා ගත හැකි ගිණුම් විවෘත නොකළ යුතුය) භාර ගනු ඇත.''

**වී. එස්. සුබ්‍රමනියම්**
ප්‍රධාන ගණකාධිකාරී.

**ඒ. ආර්. ප්‍රනාන්දු**
විනිමය පාලක.

**චක්‍ර ලේඛ අංක: එජ්සීබීඑස් 5/79**

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1979 නොවැ. මස 02 වැනි දින.

## විදේශ ව්‍යවහාර මුදල් බැංකු යෝජනා ක්‍රමය

1979. 05. 02 දතමින් යුතුව නිකුත් කරන ලද අංක 380 (එජ්සීබීඑස් 1/79) දරණ චක්‍ර ලේඛයේ අන්තර්ගත 4 (ඉ) වැනි ඡේදය සම්බන්ධවයි.

විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයකට (එජ්සීබීයු) පහත සඳහන් කාර්යයන් කිරීමට මින් බලය දෙනු ලැබේ.

(අ) අරඹන සෑම ණයවර ලිපියක්ම, නිමිති විදේශ ව්‍යවහාර මුදලකින් සඳහන්ව ඇත්තේ නම් සහ,

(i) ණය පහසුකම් පතන්නා, එක්කෝ 1979. 05. 02 දින අංක 380 (එජ්සීබීඑස් 1/79) චක්‍රලේඛයේ 7 (අ) ඡේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිත වශයෙන් නම සඳහන් කරමින් අනුමත කරන ලද අනේවාසිකයෙක් හෝ මකොආකො ව්‍යවසායකයෙක් හෝ කවර හෝ නේවාසිකයෙක් වන්නේ නම්, හා

(ii) අර්ථ ලාභියා, එක්කෝ 1979. 05. 02. දින අංක 380 (එජ්සීබීඑස් 1/79) චක්‍ර ලේඛයේ 7 (අ) ඡේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිත වශයෙන් නම සඳහන් කරමින් අනුමත කරන ලද අනේවාසිකයෙක් හෝ මකොආකො ව්‍යවසායකයෙක් හෝ කවර හෝ නේවාසිකයෙක් නම්,

ණයවර ලිපි ස්ථාපනය කිරීමට, ඇරඹීමට හා අණ කිරීමට.

(ආ) සෑම ඇපවීමක්ම, වන්දි හෝ බාර ගැනීම් නිමිති විදේශ ව්‍යවහාර මුදලකින් සඳහන්ව ඇත්තේ නම් හෝ අළුත් සහ,

(i) අනේවාසිකයෙක් හෝ මකොආකො ව්‍යවසායකයෙක් හෝ කවර හෝ නේවාසිකයෙක් වෙනුවෙන් එවැනි ඇපවීමක්, වන්දියක් හෝ පොරොන්දුවක් 1979. 05. 02 දින අංක 380 (එජ්සීබීඑස්1/79) චක්‍රලේඛයේ 7 (අ) ඡේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිත වශයෙන් නම සඳහන් කරමින් අනුමත කරන ලද්දක් නම්, හා

(ii) එවැනි සෑම ඇපවීමක්, වන්දියක් හෝ පොරොන්දුවක් අනේවාසිකයෙක් හෝ මකොආකො ව්‍යවසායකයෙක් කවර හෝ නේවාසිකයෙක් සඳහා, 1979. 05. 02 දින අංක 380 (එජ්සීබීඑස් 1/79) චක්‍රලේඛයේ 7 (අ) ඡේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිත වශයෙන් නම සඳහන් කරමින් අනුමත කරන ලද්දක් නම්,

එවැනි ඇපවීම, වන්දි පූරණ හෝ එවැනි පොරොන්දු නිකුත් කිරීමට, හෝ අලුත් කිරීමට.

(ඇ) බිල්පත් හා පිලිගැනීම් වට්ටම් කිරීමට එසේ කළයුත්තේ එවැනි වට්ටම් කරන ලද හෝ පිලිගන්නා ලද සෑම බිලපතක්ම, නිමිති විදේශ ව්‍යවහාර මුදලකින් සඳහන්ව ඇත්තේ නම් සහ 1979.05.02 දින අංක 380 (එජ්සීබීඑස් 1/79) චක්‍රලේඛයේ 7 (අ) ඡේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිත වශයෙන් නම සඳහන් කරමින් අනුමත කරන ලද අනේවාසිකයෙක් හෝ මකොආකො ව්‍යවසායකයෙක් හෝ කවර හෝ නේවාසිකයෙක් වෙනුවෙන්ය.

**වී. ඇස්. සුබ්‍රමනියම්**
ප්‍රධාන ගණකාධිකාරී.

**ඒ. ආර්. ප්‍රනාන්දු**
විනිමය පාලක.

## ආසියානු මූල්‍ය ඒකකය, බංගලිදේශ ටාකා, බුරුම ක්යාට්, ඉන්දියානු රුපියල, අයිරාන රියාල්, නේපාල රුපියල හා පකිස්ථානු රුපියල සඳහා මහ බැංකු විනිමය අනුපාතිකයන්.

මෙම අනුපාතිකයන් ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු සඳහා අදළ වේ.

(එක් එක් ව්‍යවහාර මුදල් වර්ගයේ ඒකක සියයක් සඳහා රුපියල්)

| දිනය | නිකුත් කළ චක්‍රලේඛ අංක | ආසියානු මූල්‍ය ඒකකය | | බංගලිදේශ ටාකා | | බුරුම ක්යාට් | | ඉන්දියානු රුපියල් | | අයිරාන රියාල් | | නේපාල රුපියල් | | පකිස්ථානු රුපියල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මිළදී ගැණුම් එතැන්* | විකුණුම් එතැන්** | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිලදී ගැනුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ | මිළදී ගැණුම් එතැන්† | විකුණුම් එතැන්‡ |
| 79·01·02 | 355 | 2,029·45 | 2,029·95 | 102·85 | 102·97 | 238·50 | 238·62 | 190·44 | 190·56 | 22·22 | 22·26 | 130·56 | 130·68 | 158·15 | 158·27 |
| 79·01·10 | 358 | 2,003·10 | 2,003·60 | 101·52 | 101·64 | 235·40 | 235·52 | 187·96 | 188·08 | 21·93 | 21·97 | 128·87 | 128·99 | 156·09 | 156·21 |
| 79·02·07 | 360 | 2,000·55 | 2,001·05 | 99·39 | 99·51 | 235·10 | 235·22 | 187·53 | 187·65 | 21·90 | 21·94 | 128·70 | 128·82 | 156·33 | 156·45 |
| 79·03·05 | 363 | 1,995·40 | 1,995·90 | 99·43 | 99·55 | 234·49 | 234·61 | 188·32 | 188·44 | 21·85 | 21·89 | 128·73 | 128·85 | 156·33 | 156·45 |
| 79·03·16 | 366 | 1,995·60 | 1,996·10 | 101·23 | 101·35 | 234·52 | 234·64 | 188·72 | 188·84 | 21·97 | 22·01 | 129·06 | 129·18 | 156·33 | 156·45 |
| 79·04·02 | 368 | 1,992·70 | 1,993·20 | 101·33 | 101·45 | 234·18 | 234·30 | 187·77 | 187·89 | 21·97 | 22·01 | 129·07 | 129·19 | 156·33 | 156·45 |
| 79·04·04 | 370 | 1,992·70 | 1,993·20 | 102·88 | 103·00 | 234·18 | 234·30 | 190·66 | 190·78 | 21·97 | 22·01 | 129·07 | 129·19 | 156·33 | 156·45 |
| 79·04·11 | 373 | 1,992·70 | 1,993·20 | 104·22 | 104·34 | 234·18 | 234·30 | 193·13 | 193·25 | 21·97 | 22·01 | 129·07 | 129·19 | 156·33 | 156·45 |
| 79·04·18 | 375 | 1,987·55 | 1,988·05 | 104·42 | 104·54 | 233·57 | 233·69 | 189·85 | 189·97 | 21·97 | 22·01 | 129·07 | 129·19 | 156·33 | 156·45 |
| 79·05·02 | 377 | 1,977·60 | 1,978·10 | 99·19 | 99·31 | 232·40 | 232·52 | 185·27 | 185·39 | 21·97 | 22·01 | 129·07 | 129·19 | 156·33 | 156·45 |
| 79·05·08 | 381 | 1,977·60 | 1,978·10 | 100·80 | 100·92 | 232·40 | 232·52 | 188·27 | 188·39 | 21·97 | 22·01 | 129·07 | 129·19 | 156·33 | 156·45 |
| 79·05·17 | 384 | 1,974·10 | 1,974·60 | 99·11 | 99·23 | 231·99 | 232·11 | 185·13 | 185·25 | 21·97 | 22·01 | 129·07 | 129·19 | 156·33 | 156·45 |
| 79·05·18 | 386 | — | — | — | — | — | — | 187·86 | 187·98 | — | — | — | — | — | — |
| 79·06·01 | 388 | 1,966·50 | 1,967·00 | 99·13 | 99·25 | 231·09 | 231·21 | 188·05 | 188·17 | 21·97 | 22·01 | 129·07 | 129·19 | 156·33 | 156 45 |
| 79·06·06 | 390 | — | — | 96·61 | 96·73 | — | — | 190·55 | 190·67 | — | — | — | — | — | — |
| 79·06·18 | 393 | 1,963·15 | 1,963·65 | 98·20 | 98·32 | 230·70 | 230·82 | 189·95 | 190·07 | 21·97 | 22·01 | 129·06 | 129·18 | 156·33 | 156·45 |
| 79·06·25 | 396 | 1,989·55 | 1,990.05 | 99·52 | 99·64 | 233·81 | 233·93 | 192·12 | 192·24 | 21·97 | 22·01 | 129·06 | 129·18 | 156·33 | 156·45 |
| 79·06·27 | 398 | 2,004·30 | 2,004·80 | 100·26 | 100·38 | 235·54 | 235·66 | 193·55 | 193·67 | 22·13 | 22·17 | 130·02 | 130·14 | 157·49 | 157·61 |
| 79·07·02 | 400 | 2,010·00 | 2,010·50 | 101·55 | 101·67 | 236·21 | 236·33 | 193·97 | 194·09 | 22·13 | 22·17 | 130·02 | 130·14 | 157·49 | 157·61 |
| 79·07·11 | 403 | — | — | 104·62 | 104·74 | — | — | 196·77 | 196·89 | — | — | — | — | — | — |
| 79·07·16 | 405 | 2,021·70 | 2,022·20 | 104·97 | 105·09 | 237·58 | 237·70 | 194·82 | 194·94 | 22·13 | 22·17 | 130·02 | 130·14 | 157·49 | 157·61 |
| 79·08·10 | 409 | 2,044·70 | 2,045·20 | 107·83 | 107·95 | 240·29 | 240·41 | 196·27 | 196·39 | 22·13 | 22·17 | 130·02 | 130·14 | 157·49 | 157·61 |
| 79·08·16 | 412 | 2,032·75 | 2,033·25 | 105·33 | 105·45 | 238·89 | 239·01 | 193·16 | 193·28 | 22·13 | 22·17 | 130·02 | 130·14 | 157·49 | 157·61 |
| 79·08·22 | 414 | — | — | 99·87 | 99·99 | — | — | — | — | — | — | — | — | — | — |
| 79·09·03 | 416 | 2,028·40 | 2,028·90 | 101·00 | 101·12 | 238·37 | 238·49 | 193·09 | 193·21 | 22·13 | 22·17 | 130·02 | 130·14 | 157·49 | 157·61 |
| 79·09·17 | 421 | 2,030·80 | 2,031·30 | 100·93 | 101·05 | 238·65 | 238·77 | 194·69 | 193·81 | 22·13 | 22·17 | 130·02 | 130·14 | 157·49 | 157·61 |
| 79·09·18 | 423 | — | — | 97·98 | 98·10 | — | — | 189·01 | 189·13 | — | — | — | — | — | — |
| 79·10·01 | 426 | 2,034·35 | 2,034·85 | 96·63 | 96·75 | 239·07 | 239·19 | 189·06 | 189·18 | 22·13 | 22·17 | 130·02 | 130·14 | 157·49 | 157·61 |
| 79·10·16 | 430 | 2,047·70 | 2,048·20 | 98·14 | 98·26 | 240·64 | 240·76 | 191·97 | 192·09 | 22·16 | 22·20 | 130·21 | 130·33 | 157·72 | 157·84 |
| 79·10·22 | 432 | — | — | — | — | — | — | — | — | 22·42 | 22·46 | 131·71 | 131·83 | 159·53 | 159·65 |
| 79·10·30 | 435 | 2,024·45 | 2,024·95 | 95·26 | 95·38 | 237·91 | 238·03 | 186·36 | 186·48 | 22·16 | 22·20 | 130·21 | 130·33 | 157·72 | 157·84 |
| 79·11·06 | 437 | 2,021·30 | 2,021·80 | 94·03 | 94·15 | 237·54 | 237·66 | 189·17 | 189·29 | 22·17 | 22·21 | 130·25 | 130·37 | 157·76 | 157·88 |
| 79 11·22 | 442 | 2,014·05 | 2,014·55 | 96·41 | 96·53 | 236·68 | 236·80 | 194·07 | 194·19 | 22·18 | 22·22 | 130·31 | 130·43 | 157·85 | 157·97 |
| 79·11·26 | 444 | — | — | — | — | — | — | 191·31 | 191·43 | — | — | — | — | — | — |
| 79·12·07 | 447 | 2,057·90 | 2,058·40 | 98·95 | 99·07 | 241·84 | 241·96 | 195·47 | 195·59 | 22·18 | 22·22 | 130·31 | 130·43 | 157·85 | 157·97 |
| 79·12·17 | 449 | 2,048·05 | 2,048 55 | 98·47 | 98·59 | 240·68 | 240·80 | 191·67 | 191·79 | 22·18 | 22·22 | 130·32 | 130·44 | 157·85 | 157·97 |

සමස දක්වා ඉදිරි * එතැන් ගැණුම් සඳහා මසකට වට්ටම ශත 50
** එතැන් විකුණුම් සඳහා මසකට අධි මිළ ශත 50

† එතැන් ගැණුම් සඳහා මසකට වට්ටම ශත 06,
‡ එතැන් විකුණුම් සඳහා මසකට අධිමිළ ශත 04,

කොන්ත්‍රාත්තු වෙළෙඳ බැංකුවේ මනාපය පරිදි ගතයුතු වන නමුදු කොන්ත්‍රාත්තු කාලසීමාව ඉකුත්වීමට පෙර ගනු ලැබුවේ නම් කොන්ත්‍රාත්තුවේ සඳහන් විනිමය අනුපාතිකය අනුව ගතයුතු වෙයි.

## ආසියානු නිෂ්කාශණ සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු සඳහා වෙළෙඳ බැංකු විනිමය අනුපාතිකයන්

| දිනය | නිකුත් කළ චක්‍රලේඛ අංක | ආසියානු මූල්‍ය ඒකකය (ආ. මූ. ඒ. 100) | | බංගලිදේශ ටාකා (ටාකා 100 ට) | | බුරුම ක්යාට් (ක්යාට් 100 ට) | | ඉන්දියානු රුපියල් (රුපියල් 100 ට) | | අයිරාන රියාල් (රියාල් 100 ට) | | නේපාල රුපියල් (රුපියල් 100 ට) | | පකිස්ථානු රුපියල් (රුපියල් 100 ට) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් | ගැනුම් | විකුණුම් |
| 79·01·02 | 356 | මහ බැංකුවේ ගැනුම් අනුපාතිකයට පහළින් රු. 1.50 ට නොවැඩි | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට ඉහළින් රු. 3.00 ට නොවැඩි | 102·79 | 103·01 | 238·44 | 238·66 | 190·38 | 190·60 | 22·16 | 22·30 | 130·50 | 130·72 | 158·09 | 158·31 |
| 79·01·10 | 359 | | | 101·46 | 101·68 | 235·34 | 235·56 | 187·90 | 188·12 | 21·87 | 22·01 | 128·81 | 129·03 | 156·03 | 156·25 |
| 79·02·07 | 361 | | | 99·33 | 99·55 | 235·04 | 235·26 | 187·47 | 187·69 | 21·84 | 21·98 | 128·64 | 128·86 | 156·27 | 156·49 |
| 79·03·05 | 364 | | | 99·37 | 99·59 | 234·43 | 234·65 | 188·26 | 188·48 | 21·79 | 21·93 | 128·67 | 128·89 | 156·27 | 156·49 |
| 79·03·16 | 367 | | | 101·17 | 101·39 | 234·46 | 234·68 | 188·66 | 188·88 | 21·91 | 22·05 | 129·00 | 129·22 | 156·27 | 156·49 |
| 79·04·02 | 369 | | | 101·27 | 101·49 | 234·12 | 234·34 | 187·71 | 187·93 | 21·91 | 22·05 | 129·01 | 129·23 | 156·27 | 156·49 |
| 79·04·04 | 371 | | | 102·82 | 103·04 | 234·12 | 234·34 | 190·60 | 190·82 | 21·91 | 22·05 | 129·01 | 129·23 | 156·27 | 156·49 |
| 79·04·11 | 374 | | | 104·16 | 104·38 | 234·12 | 234·34 | 193·07 | 193·29 | 21·91 | 22·05 | 129·01 | 129·23 | 156·27 | 156·49 |
| 79·04·18 | 376 | | | 104 36 | 104·58 | 233·51 | 233·73 | 189·79 | 190·01 | 21·91 | 22·05 | 129·01 | 129·23 | 156·27 | 156 49 |
| 79·05·02 | 378 | | | 99·13 | 99·35 | 232·34 | 232·56 | 185·21 | 185·43 | 21·91 | 22·05 | 129·01 | 129·23 | 156·27 | 156·49 |
| 79·05·08 | 382 | | | 100·74 | 100·96 | 234·12 | 232·56 | 188·21 | 188·43 | 21·91 | 22·05 | 129·01 | 129·23 | 156·27 | 156·49 |
| 79·05·17 | 385 | | | 99·05 | 99·27 | 231·93 | 232·15 | 185·07 | 185·29 | 21·91 | 22·05 | 129·01 | 129 23 | 156·27 | 156·49 |
| 79·05·18 | 387 | | | — | — | — | — | 187·80 | 188·02 | — | — | — | — | — | — |
| 79·06·01 | 389 | | | 99·07 | 99·29 | 231·03 | 231·25 | 187·99 | 188·21 | 21·91 | 22·05 | 129·01 | 129·23 | 156·27 | 156·49 |
| 79·06·06 | 391 | | | 96·55 | 96·77 | — | — | 190·49 | 190·71 | — | — | — | — | — | — |
| 79·06·18 | 394 | | | 98·14 | 98·36 | 230·64 | 230·86 | 189·89 | 190·11 | 21·91 | 22·05 | 129·00 | 129·22 | 156·27 | 156·49 |
| 79·06·25 | 397 | | | 99·46 | 99·68 | 233·75 | 233·97 | 192·06 | 192·28 | 21·91 | 22·05 | 129·00 | 129·22 | 156·27 | 156·49 |
| 79·06·27 | 399 | | | 100·20 | 100·42 | 235·48 | 235·70 | 193·49 | 193·71 | 22·07 | 22·21 | 129·96 | 130·18 | 157·43 | 157·65 |
| 79·07·02 | 401 | | | 101·49 | 101·71 | 236·15 | 236·37 | 193·91 | 194·13 | 22·07 | 22·21 | 129·96 | 130·18 | 157·43 | 157·65 |
| 79·07·11 | 404 | | | 104·56 | 104·78 | — | — | 196·71 | 196·93 | — | — | — | — | — | — |
| 79·07·16 | 406 | | | 104·91 | 105·13 | 237·52 | 237·74 | 194·76 | 194·98 | 22·07 | 22·21 | 129·96 | 130·18 | 157·43 | 157·65 |
| 79·08·10 | 410 | | | 107·77 | 107·99 | 240·23 | 240·45 | 196·21 | 196·43 | 22·07 | 22·21 | 129 96 | 130·18 | 157·43 | 157·65 |
| 79·08·16 | 413 | | | 105·27 | 105·49 | 238·83 | 239·05 | 193·10 | 193·32 | 22·07 | 22·21 | 129·96 | 130·18 | 157·43 | 157·65 |
| 79·08·22 | 415 | | | 99·81 | 100 03 | — | — | — | — | — | — | — | — | — | — |
| 79·09·03 | 417 | | | 100·94 | 101·16 | 238·31 | 238·53 | 193·03 | 193·25 | 22·07 | 22·21 | 129·96 | 130·18 | 157·43 | 157·65 |
| 79·09 17 | 422 | | | 100·87 | 101·09 | 238·59 | 238·81 | 194·63 | 194·85 | 22·07 | 22·21 | 129·96 | 130·18 | 157·43 | 157·65 |
| 79·09·18 | 424 | | | 97·92 | 98·14 | — | — | 188·95 | 189·17 | — | — | — | — | — | — |
| 79·10·01 | 427 | | | 96·57 | 96·79 | 239·01 | 239·23 | 189·00 | 189·22 | 22·07 | 22·21 | 129·96 | 130·18 | 157·43 | 157·65 |
| 79·10·16 | 431 | | | 98·08 | 98·30 | 240·58 | 240·80 | 191·91 | 192·13 | 22·10 | 22·24 | 130·15 | 130·37 | 157·66 | 157·88 |
| 79·10·22 | 433 | | | — | — | — | — | — | — | 22·36 | 22·50 | 131·65 | 131·87 | 159·47 | 159·69 |
| 79·10·30 | 436 | | | 95·20 | 95·42 | 237·85 | 238·07 | 186·30 | 186·52 | 22·10 | 22·24 | 130·15 | 130·37 | 157·66 | 157·88 |
| 79·11·06 | 438 | | | 93·97 | 94·19 | 237·48 | 237·70 | 189·11 | 189·33 | 22·11 | 22·25 | 130·19 | 130·41 | 157·70 | 157·92 |
| 79·11·22 | 443 | | | 96·35 | 96·57 | 236·62 | 236·84 | 194·01 | 194·23 | 22·12 | 22·26 | 130·25 | 130·47 | 157·79 | 158·01 |
| 79·11·26 | 445 | | | — | — | — | — | 191·25 | 191·47 | — | — | — | — | — | — |
| 79·12·07 | 448 | | | 98·89 | 99·11 | 241·78 | 242·00 | 195·41 | 195·63 | 22·12 | 22·26 | 130·25 | 130·47 | 157·79 | 158·01 |
| 79·12·17 | 450 | | | 98·41 | 98·63 | 240·62 | 240·84 | 191·61 | 191·83 | 22·12 | 22·26 | 130·26 | 130·48 | 157·79 | 158·01 |

## වෙළෙඳ බැංකුවලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන්

| වක්‍රලේඛ අංකය හා ක්‍රියාත්මක වන දිනය | ඕස්ට්‍රේලියානු ඩොලර් (ඩොලර් 1 කට) | ඔස්ට්‍රියානු ෂිලිං (ෂිලිං 100 කට) | බහරේන් ඩිනාර් (ඩි. 1/.) | බෙල්ජියානු ෆ්‍රෑන්ක් (බෙ. ෆ්‍රෑ. 100/-) | කැනේඩියානු ඩොලර් (ඩොලර් 1/-) | ඩෙන්මාර්ක් ක්‍රෝනර් (ක්‍රෝ 10/-) | ඩොයිෂ් මාර්ක්ස් (ඩොයි. මා. 10) (බටහිර ජර්මනිය) | ප්‍රංශ ෆ්‍රෑන්ක් (ප්‍ර. ෆ්‍රෑ. 10/-) | හොංකොං ඩොලර් (ඩො. 10/-) | ඉතාලියානු ලීරා (ලීරා 1000) | ජපන් යෙන් (යෙන් 1000/-) | කුවේට් ඩිනාර් (ඩිනාර් 1/-) | මැලේසියානු රින්ගිට් (රින්ගිට් 10/-) | නෙදර්ලන්ත ගිල්ඩර් (ගිල්. 10/-) | නෝර්වීජියානු ක්‍රෝනර් (ක්‍රෝ. 10/-) | ඕමාන් රියාල් (රි. 1/-) | කටාර් රියාල් (රි. 10/-) | සවුදි අරාබි රියාල් (රි. 10/-) | සිංගප්පූරු ඩොලර් (ඩො. 10/-) | ස්වීඩන් ක්‍රෝනර් (ක්‍රෝ. 10/-) | ස්විස් ෆ්‍රෑන්ක් (ෆ්‍රෑ. 10/-) | එක්සත් අරාබි ධිර්හැම් (ධිර්හැම් 10/-) | එ. රා. පවුම (පවුම 1/-) | එ. ජ. ඩොලර් (ඩො. 1/-) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 357 ජනවාරි 05, 1979 .. | 16·65 | 107·65 | 37·90 | 49·95 | 12·25 | 28·35 | 78·75 | 34·35 | 30·60 | 17·45 | 73·95 | 53·30 | 65·75 | 72·95 | 28·85 | 42·10 | 37·95 | 43·90 | 67·05 | 33·60 | 88·50 | 37·90 | 29·35 | 14·55 |
| 362 පෙබරවාරි 13, 1979 .. | 16·55 | 107·75 | 38·00 | 49·85 | 12·20 | 28·45 | 78·75 | 34·30 | 30·35 | 17·45 | 73·15 | 53·10 | 66·30 | 72·95 | 28·75 | 42·15 | 37·95 | 43·35 | 67·05 | 33·55 | 87·65 | 37·95 | 29·20 | 14·55 |
| 365 මාර්තු 06, 1979 .. | 16·35 | 107·05 | 37·90 | 49·65 | 12·25 | 28·05 | 78·40 | 34·00 | 30·20 | 17·30 | 71·15 | 52·90 | 66·20 | 72·65 | 28·60 | 42·10 | 37·90 | 43·30 | 66·95 | 33·35 | 86·80 | 37·90 | 29·40 | 14·55 |
| 372 අප්‍රියෙල් 09, 1979 .. | 16·55 | 107·05 | 38·70 | 49·65 | 12·90 | 28·30 | 78·55 | 34·30 | 29·55 | 17·65 | 69·30 | 53·65 | 66·95 | 73·00 | 28·95 | 43·00 | 38·70 | 44·05 | 67·55 | 33·85 | 86·80 | 38·70 | 31·10 | 14·85 |
| 383 මැයි 14, 1979 .. | 16·60 | 107·00 | 38·95 | 49·40 | 12·85 | 27·95 | 78·85 | 34·10 | 29·60 | 17·60 | 70·30 | 53·95 | 67·35 | 72·35 | 28·85 | 43·25 | 39·70 | 44·25 | 67·90 | 34·10 | 87·15 | 38·95 | 30·55 | 14·95 |
| 392 ජූනි 13, 1979 .. | 16·55 | 106·30 | 39·00 | 48·75 | 12·75 | 27·15 | 78·35 | 33·85 | 29·15 | 17·55 | 68·30 | 53·80 | 67·50 | 71·55 | 28·80 | 43·35 | 39·80 | 44·05 | 67·95 | 34·15 | 86·10 | 39·00 | 30·90 | 14·95 |
| 402 ජූලි 06, 1979 .. | 16·80 | 111·70 | 39·10 | 51·05 | 12·85 | 28·40 | 81·85 | 35·20 | 29·30 | 18·20 | 69·30 | 54·30 | 69·25 | 74·25 | 29·65 | 43·35 | 40·05 | 44·35 | 69·25 | 35·35 | 90·95 | 39·40 | 33·45 | 14·95 |
| 407 ජූලි 26, 1979 .. | 17·00 | 112·25 | 39·35 | 51·80 | 12·80 | 28·80 | 82·70 | 35·50 | 28·90 | 18·40 | 69·65 | 54·70 | 70·00 | 75·25 | 29·85 | 43·25 | 39·90 | 44·45 | 70·00 | 35·75 | 91·50 | 39·35 | 34·75 | 14·95 |
| 408 අගෝස්තු 03, 1979 .. | 16·90 | 112·05 | 39·45 | 51·10 | 12·75 | 28·35 | 81·75 | 35·20 | 29·05 | 18·25 | 69·10 | 54·45 | 69·45 | 74·50 | 29·75 | — | 40·00 | 44·55 | 69·50 | 33·55 | 90·25 | 39·50 | 34·05 | 14·95 |
| 411 අගෝස්තු 13, 1979 .. | 16·95 | 113·10 | 39·45 | 51·50 | 12·80 | 28·60 | 82·50 | 35·40 | 29·05 | 18·35 | 69·45 | 54·50 | 69·50 | 75·05 | 30·00 | 43·35 | 40·05 | 44·65 | 69·50 | 35·65 | 91·35 | 39·55 | 33·75 | 15·00 |
| 420 සැප්තැම්බර් 10, 1979 . | 16·90 | 114·90 | 39·45 | 51·65 | 12·85 | 28·75 | 83·00 | 35·50 | 29·45 | 18·45 | 67·85 | 54·25 | 69·75 | 75·50 | 30·20 | 43·35 | 40·00 | 44·60 | 69·80 | 35·70 | 92·15 | 39·50 | 33·65 | 14·95 |
| 425 සැප්තැම්බර් 24, 1979 . | 16·90 | 114·90 | 39·45 | 51·65 | 12·85 | 28·75 | 83·00 | 35·50 | 29·45 | 18·45 | 67·85 | 54·25 | 69·75 | 75·50 | 30·20 | 43·35 | 40·00 | 44·60 | 69·80 | 35·70 | 92·15 | 39·50 | 32·50 | 14·95 |
| 428 ඔක්තෝබර් 10, 1979 . | 16·85 | 116·80 | 39·55 | 52·10 | 12·80 | 28·75 | 84·10 | 35·85 | 30·30 | 18·20 | 66·55 | 54·35 | 69·65 | 75·70 | 30·35 | 43·50 | 40·15 | 39·65 | 69·75 | 35·90 | 92·85 | 44·85 | 32·40 | 15·00 |
| 429 ඔක්තෝබර් 12, 1979 . | 16·80 | 117·25 | 39·55 | 51·95 | 12·80 | 28·70 | 83·85 | 35·70 | 30·05 | 18·15 | 66·30 | 54·30 | 69·50 | 75·75 | 30·30 | 43·45 | 40·10 | 44·70 | 69·65 | 35·70 | 92·55 | 39·60 | 32·50 | 15·00 |
| 434 ඔක්තෝබර් 23, 1979 . | 16·65 | 116·15 | 39·30 | 51·80 | 12·70 | 28·60 | 83·35 | 35·60 | 29·90 | 18·10 | 64·15 | 53·95 | 69·10 | 75·30 | 30·10 | 43·20 | 39·90 | 44·75 | 69·35 | 35·50 | 90·15 | 39·65 | 32·25 | 15·05 |
| 439 නොවැම්බර් 13, 1979 . | 16·45 | 116·15 | 40·75 | 52·00 | 12·65 | 28·45 | 84·05 | 35·85 | 30·00 | 18·15 | 61·10 | 53·80 | 68·55 | 75·60 | 29·90 | 44·45 | 40·45 | 44·65 | 68·85 | 35·45 | 91·40 | 40·00 | 31·65 | 15·05 |
| 446 නොවැම්බර් 29, 1979 . | 16·30 | 118·70 | 39·60 | 52·50 | 12·75 | 28·75 | 85·50 | 36·40 | 29·90 | 18·15 | 60·05 | 53·60 | 68·35 | 76·65 | 29·80 | 43·05 | 40·00 | 44·25 | 68·35 | 35·60 | 91·25 | 39·60 | 32·45 | 14·90 |